# රවි (රවීන්ද්‍ර විමල්) ජයවර්ධන
## ඔබට සුබ ගමන්



> **වෘත්තියෙන් ගුවන් නියමුවෙකු වූ ඔහු එවකට එයා ලංකා සමාගමේ සාමාන්‍ය ගුවන් නියමුවෙකු ලෙස සේවය කළේය.තම පියා විසින් සිංගප්පූරු ගුවන් සේවයේ සහය ඇතිව ආරම්භ කල එයා ලංකා සමාගමේ සභාපති හෝ අනික් තනතුරු ලබා ගැනීමට ඔහුට වුවමනාවක් නොවීය.**

රවී ජයවර්ධන යනු ශ්‍රී ලංකාවේ ප්‍රථම විධායක ජනාධිපති ජේ ආර් ජයවර්ධන මහතාගේ එකම දරුවාය. වයස 80 ක් වූ ඔහු අප්‍රේල් 3 වන දා දිවියෙන් සමුගත්තේය. රටක පාලකයෙකුගේ දරුවෙකු කෙසේ හැසිරිය යුතුද යන්න ගැන ඔහු ලොවටම ආදර්ශයක් විය. සිය පියා රටේ විධායක ජනාධිපති ලෙස සිටි අවුරුදු 10 ක කාලය තුල ඔහු තම පියාගේ තනතුර අභාවිතා කල එකම සිද්ධියක් හෝ අසන්නට නොලැබිණි. පියා එ.ජා.ප ආරම්භක සාමාජිකයෙකු වූවත්, රටම දන්නා දේශපාලකයෙකු වූවත් රවී ජයවර්ධන කිසිදිනක දේශපාලනය නොපැමිණියේය. ඔහුට පෙර රටේ නායකයින් වූ ඩී.එස්.සේනානායක, එස්.ඩබ්.ආර්.ඩී සහ සිරිමා බණ්ඩාරණායක යන අයගේ දරුවන් දේශපාලනයට පැමිණියත් රවී ජයවර්ධන ඔවුන්ගේ දරුවන්ව ආදර්ශයට ගත්තේ නැත. අවාසනාවකට ජේ ආර් ට පසුව රටේ නායකත්වයට පැමිණි ආර්. ප්‍රේමදාස සහ මහින්ද රාජපක්ෂ වැනි අයගේ දරුවන් රවී ජයවර්ධනව ආදර්ශයට ගත්තේත් නැත.

එවකට දේශපාලනයට පැමිණි බොහෝ දෙනෙක් එසේ කළේ රටට සේවය කිරීමේ බලාපොරොත්තුවෙනි. එම නිසා රවී ජයවර්ධන දේශපාලනයට නොපැණීම ඔහුට රට ගැන ආදරයක් නොමැති පුද්ගලයෙකු යැයි යමෙකුට තර්ක කල හැකිය. එය එසේ නොවන බව කීමට සමහරක් දන්නා උදාහරණ දෙකක් දැක්විය හැකිය. ජේ ආර් පාලන සමයේ ත්‍රස්තවාදීන් මායිම් ගම්මාන වල වැසියන් ඝාතනය කිරීම් සිදුවෙද්දී ඒවා වැලැක්වීමට යුධ රවී ජයවර්ධන තම පෞද්ගලික කාලය යොදවමින් හමුදාව සමග හ එම වැසියන් සමග විවිධ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කලේය. ඔහු එම කටයුතු සඳහා විශේශ පිළිගැනීමක් හෝ ප්‍රසිද්ධිය බලාපොරොත්තු නොවීය.

වෘත්තියෙන් ගුවන් නියමුවෙකු වූ ඔහු එවකට එයා ලංකා සමාගමේ සාමාන්‍ය ගුවන් නියමුවෙකු ලෙස සේවය කළේය.තම පියා විසින් සිංගප්පූරු ගුවන් සේවයේ සහය ඇතිව ආරම්භ කල එයා ලංකා සමාගමේ සභාපති හෝ අනික් තනතුරු ලබා ගැනීමට ඔහුට වුවමනාවක් නොවීය.

රටේ තිබූ ආරක්ශක තත්ත්වය නිසා ස්ව අධ්‍යනයෙන් ආරක්ෂක කටයුතු පිළිබඳව පුළුල් අවබෝධයක් ලබාගත් ඔහු පිළිගත් ආරක්ෂක විශේෂඥයෙකු බවට පත්විය. තම දැනීම යොදාගෙන රට වෙනුවෙන් ඔහු සිදුකල අනික් සම්මාදම 30 අවුරුදු කාලයේදී යුද්ධයෙන් විය හැකිව තිබූ විශාල හානි වැළැක්වූවක් විය. ස්වේච්චාවෙන් තම පියාගේ ආරක්ෂක උපදේශක ලෙස ක්‍රියා කරමින් සම්මත ක්‍රම වලට ත්‍රස්තවාදීන්ට මුහුණ දෙමින් සිටි යුධ හමුදාවට සහය පිණිස විශේෂ කාර්‍යය බලකාය (Special Task Force or STF) හඳුන්වා දෙනු ලැබුවේ රවී ජයවර්ධන විසිනි. බ්‍රිතාන්‍ය විශේෂ බලකායන්හී (British Special Force) සේවය කල ඉවත්වූ පිරිසක් ලංකාවට ගෙන්වා ශ්‍රී ලංකා පොලීසියේ තෝරාගත් පිරිසක් පුහුණු කරවමින් පොලිස් විශේෂ කාර්‍යය බලකාය පිහිටුවීමට ඔහු ගත් එම ක්‍රියාමාර්ගය මුළු යුද්ධ කාලයේදීම හමුදාවන්ට සුවිසල් ශක්තියක් විය. රටපුරා භීතිය පතුරමින් සිටි බෙදුම්වාදී ත්‍රස්තවාදීන්ට බිය යන්නෙ කුමක්ද යන්න ගැන හැඟීම ලබා දුන්නේ මෙම බලකායයි. වසර කිහිපයක්ම නැගෙනහිර පළාතේ රාජ්‍ය බලය පවත්වා ගත්තේ නොහැක්කක් නොමැත යන උත්ප්‍රේරක පාඨය පෙරටු කර ගෙන ක්‍රියාත්මක වූමෙම පොලිස් විශේෂ කාර්ය බලකායයි.

පියාගේ තනතුර අභාවිතා කොට රජයේ දේපල සොරා නොගත් රවී ජයවර්ධන තම පියා මිය ගිය පසු පියා ගේ කැමැත්ත අනුව යමින් පාරම්පරික දේපල රට වෙනුවෙන් පරිත්‍යාග කලේය.

ඔහු සතු විශේෂ ගුණාංගයක් වූයේ නිහතමානී කමයි. රටේ විධායක ජනාධිපති ගේ බිරිඳ වූවද කිසිම දේශපාලන කටයුත්තකට අත නොපෙවූ අතිශයින් නිහතමානී  අයකුවූ එලීනා ජයවර්ධන ආර්‍යාවගෙන් එම අභාශය ඔහුට ලැබෙන්නට ඇත. ඔහුගේ වැඩිමල් නිවුන් දරුවන් දෙදෙනා මගේ පාසැලේ සමකාලීනයන් වූහ. රටේ විධායක ජනාධිපතිවරයාගේ මුණුපුරන් වූ ඔවුන්ගේ දිවි පෙවෙත අන් ශිෂ්‍යයන්ගෙන් කිසි ලෙසකින් වෙනස්වූයේ නැත. ඔවුන් විශේෂ පිළිගැනීමක් බලාපොරොත්තු වූයේ වත් එවන් විශේශ පිළිගැනීමක් කිසිවෙක් ඔවුන්ට දැක්වූයේවත් නැත. ඔවුන්ගේ මව එනම් රවී ජයවර්ධන ගේ බිරිඳ කුඩා දරුවෙකු වඩා ගෙන විද්‍යාලයේ කොරිඩෝවේ තනියම ඇවිද යනු මම කී විටක් දැක ඇත්තෙමි. ආදි සිසු ක්‍රියාකාරකම් වලදී ඉඳ හිට හමුවන මෙම දරුවන් අදටත් එදා මෙන්ම අතිශයින් නිහතමානී දෙදෙනෙකි.

මෙම සටහන මිය ගිය රවි ජයවර්ධන මහතාට උපහාරයක් වේවා. ඔබ දුන් ආදර්ශය දේශපාලනයේ යෙදෙන දෙමව්පියන් සිටින දරුවන්ට ආදර්ශයක් වේවා.

ඔබට සුබ ගමන්

http://lankanian.blogspot.com.au/